(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 126.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 ජනවාරි 23 සිකුරාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1398/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් සහ ලාහුගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ගොවීන්ට වාරි ජල ව්‍යාපෘති හරහා ජලය ලබා දිය යුතු බවත්;

(ii) එම ගොවීන්ට වාරි ජලය ලබා දීමේ අරමුණින් 2018, 2019 සහ 2020 වර්ෂවලදී පිළිවෙළින් රුපියල් මිලියන 150ක්, රුපියල් මිලියන 25ක් සහ රුපියල් මිලියන 50ක් වැය කරමින් එවකට පැවති රජයන් විසින් 'හැඩඔය' වාරි ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ගොවීන්ට වාරි ජලය ලබා දීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද ඉහත ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ඉහත (අ)(i)හි සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජීවත් වන ගොවීන්ගේ කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබා ගැනීමට හැකි බැවින් එම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1465/2025

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ ක්‍රියාත්මක වන ආයතනවල 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ආදායම් සහ වියදම් වාර්තා වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත පදනමේ 2025 වර්ෂය සඳහා ආදායම් විස්තර කවරේද;

(iii) සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනමේ කළමනාකරණ මණ්ඩලය 2025 වර්ෂය තුළදී රැස්වී ඇති වාර ගණන සහ ගනු ලැබූ විශේෂ තීන්දු/තීරණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හැටන් ප්‍රදේශයේ ඇති තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ වත්මන් ක්‍රියාකාරිත්වය කවරේද;

(ii) 2025 වර්ෂයේදී එම මධ්‍යස්ථානයේ පුහුණුවීම් සහ පාඨමාලා සඳහා ඇතුළත් කරගෙන ඇති සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) නෝර්වුඩ් ක්‍රීඩාංගණයෙන් ආදායම් ඉපැයීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1499/2025

ගරු බී. ආරියවංශ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය' යටතේ රත්නපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති අතරින් මේ වනවිට අතරමඟ නතර කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘති නැවත ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1541/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යටියන්තොට සහ බුලත්කොහුපිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ඉදිකර ඇති කුඩා ජල විදුලි බලාගාර සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම බලාගාර ඉදිකිරීමේදී නීත්‍යානුකූල අවසරය ලබා ගෙන තිබේද;

(iii) එම එක් එක් විදුලි බලාගාරයෙන් ජාතික විදුලිබල පද්ධතියට එක් කරනු ලබන ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කුඩා විදුලි බලාගාර හිමිකරුවන් විසින් පරිසර පද්ධතිය රැක ගැනීම සඳහා සහ සමාජීය පරිසරය සංවර්ධනය සඳහා ගිවිසුම් ප්‍රකාරව සිදු කළ යුතු කාර්යයන් නිසි පරිදි සිදු කරන්නේද;

(v) සියලුම කුඩා ජල විදුලි බලාගාර නියාමනය කරන්නේද;

(vi) අදාළ නියාමන නිර්ණායකයන්ට අනුකූල නොවන කුඩා ජල විදුලි බලාගාර හිමිකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1557/2025

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්ත ශාලා සතු වගා ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම්වලින් වගා කටයුතු සඳහා යොදා ගන්නා සහ යොදා නොගන්නා ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කර්මාන්ත ශාලාවල, සීනි හා එතනෝල් නිෂ්පාදන කටයුතු අපේක්ෂිත මට්ටමින් සිදුවන්නේද;

(iv) 2020 වර්ෂයේ සිට මේ දක්වා, එම කර්මාන්ත ශාලා මඟින් සිදු කරනු ලැබූ වාර්ෂික සීනි නිෂ්පාදනය සහ අලෙවිය කොපමණද;

(v) එම කර්මාන්ත ශාලා මඟින් උක් ලබා ගැනීමේ ක්‍රියාවලිය ඇණහිට තිබීම නිසා උක් ගොවීන් අපහසුතාවයට පත්ව ඇති බව දන්නේද;

(vi) අදාළ සමාගම් මඟින් සේවක වැටුප්, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා කළ යුතු ගෙවීම් නිසි පරිදි සිදු නොවන බවට වාර්තා වන බැවින්, එම තත්ත්වයන් මඟහරවා ගැනීමට කටයුතු කරන්නේද;

(vii) මෙම සමාගම්වල ක්‍රියාකාරිත්වය හා සේවක අයිතිවාසිකම් නිසි පරිදි ඉටු කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1565/2025

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාගම නගරයේ නාගරික සංවර්ධන අධිකාරිය සතු මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම භූමිය තුළ අනවසරයෙන් ඉදිකරන ලද ව්‍යාපාරික ස්ථාන තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ පිවිසුම් දොරටුව ඉදිරිපිට ගුවන් පාලම ආරම්භ වන ස්ථානයේ ඇති නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමේ පිහිටුවා ඇති පොලිස් මුරපොළ වටකර කඩ කාමර ඉදිකර ඇති බව දන්නේද;

(ii) එසේ කඩ කාමර ඉදිකරන මුල් අවස්ථාවේදී, අධිකාරියේ රාගම නගරය භාර ක්ෂේත්‍ර නිලධාරින් විසින් ඒ සම්බන්ධයෙන් අධිකාරිය දැනුම්වත් කර තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඒ අනුව එම ඉදිකිරීම් ඉවත් කර තිබේද;

(v) නොඑසේ නම්, එම ඉදිකිරීම් ඉවත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1636/2025

ගරු රුවන් විජේවීර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයට අයත් සමස්ත භූමි ප්‍රමාණය හා එම භූමි ප්‍රමාණයෙන් වනජීවී දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පවතින භූමි ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) කිසියම් භූමි ප්‍රමාණයක්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට ගැනීමේදී යොදා ගැනෙන නිර්ණායක කවරේද;

(iv) 2021 දී, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් යටතට පවරා ඇති මොනරාගල දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ඒ අතරින්, ප්‍රාදේශීය ලේකම් විසින් දීර්ඝ කාලීන බදු පදනම මත නිදහස් කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(vi) එසේ නම්, ඒ කුමන ආයතන හෝ පුද්ගලයන්ටද;

(vii) මෙම පැවරීම් ක්‍රියාවලිය තුළ, මොනරාගල දිස්ත්‍රික්කයේ 'වන්දම—දෙමලිය' රක්ෂිතයට අයත් භූමි ප්‍රමාණය හා මේ වනවිට ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කර ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කර ඇති භූමි ප්‍රමාණයෙන් බදු පදනම මත නිදහස් කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1677/2025

ගරු ඔෂානි උමංගා මහත්මිය,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජකාරියේදී මිය ගිය ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ වැන්දඹුවන්/යැපෙන්නන් සඳහා ලබා දෙමින් පැවති වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් හෝ දීමනා ගෙවීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(ii) එම ප්‍රමාදවීම් වලක්වා ගැනීමට ගනු ලබන පියවර කවරේද;

(iii) ආබාධිත හේතුව මත සේවයෙන් ඉවත්වීමෙන් පසුව විවාහවූ හමුදා සාමාජිකයන් මිය ගිය පසු ඔවුන්ගේ වැන්දඹුවන්/යැපෙන්නන් සඳහා ගෙවනු ලබන වැටුප් හා දීමනා කවරේද;

(iv) ඔවුන් සඳහා දීමනා නොගෙවන්නේ නම්, එයට හේතු කවරේද;

(v) එම වැටුප් හෝ දීමනා ගෙවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2009.05.19 දිනට පෙර බඳවාගත් හමුදා සාමාජිකයන්ගෙන් 85%ක විශ්‍රාම වැටුප් හිමිකමක් නොලබන සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්‍රාම වැටුප් හිමිකම නොගෙවීම සඳහා හේතු කවරේද;

(iii) ඔවුන් සඳහා 85%ක විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සුදුසු බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඔවුන්ට එම විශ්‍රාම වැටුප් හිමිකම ගෙවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1738/2025

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බදුල්ල දිස්ත්‍රික්කයේ —

(i) සමුපකාර අලෙවිසැල් සංඛ්‍යාව;

(ii) වතු ආශ්‍රිතව ක්‍රියාත්මක වන සමුපකාර අලෙවිසැල් සංඛ්‍යාව;

(iii) පසුගිය වසර 10 තුළ වැසී ගිය සමුපකාර අලෙවිසැල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වතු ආශ්‍රිතව නිවාස ඉදිකිරීම සහ ණය ලබාදීම සඳහා සමුපකාර සංගම් ඇති බව දන්නේද;

(ii) එසේ නම්, බදුල්ල දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව ක්‍රියාත්මක වන සමුපකාර සංගම් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1784/2025

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පැවති තාක්ෂණික සේවය මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එහි සේවය කරනු ලබන තාක්ෂණ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම නිලධාරීන්ට ක්ෂේත්‍ර රාජකාරි සඳහා කි.මී. 1කට ගෙවනු ලබන ගමන් වියදම් දීමනාව කොපමණද;

(iv) තාක්ෂණ නිලධාරීන්ට ගෙවනු ලබන සංයුක්ත දීමනාව කොපමණද;

(v) එම දීමනාව අනුමත කරන ලද දිනය කවරේද;

(vi) මෙම නිලධාරීන්ගේ උසස්වීමේ කාර්ය පටිපාටිය යාවත්කාලීන කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2026 වර්ෂය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට නිවාස ඉදිකිරීම වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) එම ප්‍රතිපාදන ප්‍රමාණයට සාපේක්ෂව අධිකාරිය සතු තාක්ෂණික නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*9.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

10.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---